ඔක්තෝබර් පළමු සතිය තුළ ලංකාදීප පුවත්පතේ සහ ලංකාදීප ඔන්ලයින් සංස්කරණයේ පළ වූ පුවත් වාර්තාවන් කිහිපයක්...

1) "යොහානිට වශීවූ ඉන්දියාව" යන මැයෙන් පළ වූ ඡායාරූපයක් පළ විණි. එය සැබවින්ම ඉන්දියාවේ යොහානි පිළිගැනීමට පැමිණි පිරිසකගේ ඡායාරූපයක් නොව, ජපානයේ වෙනත් අවස්ථාවක ඡායාරූපයක් බව හෙළිවිණි. පුවත්පත ඒ සම්බන්ධයෙන් කණගාටුව දැක්වීමක් හා පැහැදිලි කිරීමක් පළ කරන ලදී.

2) ලංකාදීප ඔන්ලයින් හි පළ වූ, දිවි තොර කොට ගත් යුවළක් පිළිබඳ පුවත් වාර්තාවක, එම යුවළ දිවි තොර කරගෙන සිටිනා සංවේදී ඡායාරූපයක් පළ වී තිබිණි. එය පසුව ඉවත් කොට වෙනත් ඡායාරූපයක් යොදා පුවත සංශෝධනය කෙරිණි. ඒ පිළිබඳව කණගාටුව දැක්වීමක් හෝ පැහැදිලි කිරීමක් දක්නට නොලැබුණි.

3) "තොටිල්ල පද්දන දැත් තුනක් පොලිසියේ ඉහළට" යන සිරස්තලය සමගින් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරියන්ට උසස්වීම් ලැබීමේ පුවතක් පළ කර තිබිණි. මෙය ස්ත්‍රීපුරුෂ භාවය පදනම් කරගනිමින් කාන්තාව ඒකාකෘතික කිරීමක් බවට අදහස් පළවීම සමගින්, එම සිරස්තලය වෙනස් කෙරී තිබිණි. ඒ පිළිබඳව කණගාටුව දැක්වීමක් හෝ පැහැදිලි කිරීමක් දක්නට නොලැබුණි.

පුවත් වාර්තාවක ගැටළුකාරී බවක් දුටු විට හෝ පාඨකයින් පුවත් වාර්තාවක් ගැටළුකාරී බවට ප්‍රතිචාර දැක්වූ විට, එය සංශෝධනය කිරීම ප්‍රශංසනීය වේ.

කෙසේ නමුත්, පළමු පුවත බහු මූලාශ්‍ර ඔස්සේ තහවුරු කරගැනීමටත්, දෙවන පුවත දිවි තොර කරගැනීම් පිළිබඳ මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූලව ඉදිරිපත් කිරීමටත්, තුන්වන පුවත ස්ත්‍රී පුරුෂ භාවය ඔස්සේ සිදුවන ඒකාකෘතික කිරීම් අත් හැර ඉදිරිපත් කිරීමටත් ක්‍රියාත්මක වූයේ නම්, මෙම සංශෝධනයන් වළක්වා ගැනීමට තිබුණේ නොවේද?

**#MediaEthicsSL #lka #sinhalanews #Mawbima #Lankadeepa #LankadeepaOnline**